# කැලණිය විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව

## දුරස්ථ සහ අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය

ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) උපාධි ප්‍රථම පරීක්ෂණය (බාහිර) - 2015

2020 පෙබරවාරි - අප්‍රේල්

මානවශාස්ත්‍ර පීඨය

## බෞද්ධ දර්ශනය

භාරතීය දාර්ශනික පසුබිම සහ බෞද්ධ දර්ශනයේ මූලධර්ම BUPH E - 1015

ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සපයන්න.

ප්‍රශ්න සංඛ්‍යාව : (10) දහයයි. කාලය : පැය 03 යි.

---

1. ඉන්දුනිම්න ශිෂ්ටාචාරයේ පැවැති සරල ආගමික විශ්වාස පිළිබඳ සමාලෝචනයක් ඉදිරිපත් කරන්න.

2. භෞතික පරිසරයේ අපූර්ව ක්‍රියාකාරිත්වය වෛදික දේව විශ්වාස කෙරෙහි බලපාන ලද අයුරු බහුදේවවාදය ඇසුරින් විමසන්න.

3. බ්‍රාහ්මණ සමාජයේ ප්‍රචලිතව පැවැති යාග කර්ම පිළිබඳ ලුහුඬු විවරණයක් සපයමින්, එමගින් අපේක්ෂිත ලෞකික මෙන්ම ලෝකෝත්තර අරමුණු පැහැදිලි කරන්න.

4. "උපනිෂද්" යන වචනය විග්‍රහකොට, එම දර්ශනයෙන් පිළිබිඹුවන "බ්‍රහ්මන්" සහ "ආත්මන්" සංකල්ප ප්‍රමාණවත් පරිදි විවරණය කරන්න.

5. බුද්ධකාලීන භාරතයේ විසූ කිරියවාදී ශාස්තෘවරයෙකුගේ ඉගැන්වීම් කෙටියෙන් ගෙනහැර දක්වන්න.

6. නිත්‍යාත්මවාදය නිශේධනය කරනු පිණිස ත්‍රිලක්ෂණ මූලධර්මය උපයෝගීවන අයුරු මූලාශ්‍රය නයින් සනාථ කරන්න.

7. දුක්ඛ නිරෝධගාමිනී ප්‍රතිපාද මාර්ග සත්‍යය පිළිබඳ සූත්‍රානුසාරයෙන් විවරණයක් කොට එහි ලෞකික උපයෝගීතාව විස්තර කරන්න.

8. නිවන් අවබෝධකළ පුද්ගලයාගේ ස්වභාවය විස්තර කිරීම පිණිස "නිබ්බන්ති ධීරා යථායං පදීපො" යන පාඨය පදනම් කරගත හැකිදැයි පරීක්ෂා කරන්න.

9. කර්මය පිළිබඳ බෞද්ධ ඉගැන්වීමෙන් නියතිවාදයක් හෝ පුබ්බේකත හේතුවාදයක් ප්‍රකට නොවන අයුරු පැහැදිලි කරන්න.

10. පහත සඳහන් මාතෘකා අතුරින් දෙකකට ප්‍රමාණවත් සටහන් ලියන්න.
    - I. මජ්ඣිමා දෙසනා
    - II. මක්ඛලීගොසාල
    - III. පඤ්චක්ඛන්ධ
    - IV. පුනබ්භව

******************************